# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ කළමනාකරණ සහකාර, සහකාර තාක්ෂණ බණ්ඩ 2 (MT 2-2016) සේවා ගණයේ III ශ්‍රේණිය ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

සබරගමුව පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවෙහි ක්‍රීඩා නිලධාරී III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2021.04.10 දිනට වයස අවුරුදු 18 ට වැඩි සහ 35 ට නොවැඩි සුදුසුකම් ලත් සබරගමුව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය 2021 අප්‍රේල් මාසයේදී පමණ පැවැත්වීමට අපේක්ෂිතය.

**01. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය : 2021.04.10**

**02. බඳවා ගැනීමේ සුදුසුකම් :**

**අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්**

(අ) I. මවුබස (සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගෙන තිබීම. (සාමාන්‍ය ඉංග්‍රීසි හා සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

සහ

III. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් මට්ටමින් (දිස්ත්‍රික් අතර) පැවැත්වෙන තරගයන්හි දී 1 හෝ 2 ස්ථානයන් ලබා තිබීම, ජාතික මහා ක්‍රීඩා උළෙලේ 1, 2 හෝ 3 ස්ථාන ලබා තිබීම, ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරගවල 1,2 හෝ 3 ස්ථාන ලබා තිබීම

හෝ

(ආ) I. මවුබස (සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම

සහ

II. දකුණු ආසියාතික තරග, ආසියාතික තරග, පොදු රාජ්‍ය මණ්ඩලීය තරග, ලෝක ශූරතා තරග හෝ ඔලිම්පික් තරග සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර තිබීම.

04. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

05. **මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය :**

අංක 3/2016 හා 2016.02.25 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 2 (MT 2-2016) වැටුප් කාණ්ඩය MT - 02-2016 වන අතර, මාසික වැටුප් පරිමාණය රු. 30,140-10x350-11x370-10x560-10x660 - රු. 49,910/- වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

06. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇති විට ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත විෂයයන් දෙකම සමත් අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 විධිවිධාන පරිදි ඉහළම කුසලතා අනුපිළිවෙළ අනුව දිස්ත්‍රික් ජන අනුපාතය මත හා දිස්ත්‍රික් කුසලතා පදනම් කරගනිමින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සමත්වීම සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40% කි.

වෘත්තීය පරීක්ෂණය සඳහා යොමු කළ අයදුම්කරුවන් සියලු දෙනා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම අයදුම්කරුවන් විසින් ලිඛිත තරග විභාගයේ සහ වෘත්තීය පරීක්ෂණයේ ලබා ගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙළ මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

07. මෙම බඳවා ගැනීමේ සම්පූර්ණ නිවේදනය සහ ආදර්ශ අයදුම්පත්‍රය www.sg.gov.lk හා www.psc.sg.gov.lk වෙබ් අඩවිවල පළකර ඇත.

**පී.එස්.ආර්.එම්. විජයරාජ**
**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,**
**සබරගමුව පළාත.**
**2021.02.22**

Source: Dinamina (2021.03.05)